CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY (SUCCESSOR TO ICTAD)

# ලංසු සඳහා ආරාධනයයි

## ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**2024/2025 වසර සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයත් නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ සනීපාරක්ෂක පවිත්‍රතා සේවා පවත්වාගෙන යාම**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයත් නො 33, සුනිල් මාවත, පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයෙහි පිහිටි නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ 2024/2025 වසර සඳහා සනීපාරක්ෂක පවිත්‍රතා සේවාව ලබාගැනීම සඳහා පහත සඳහන් උපලේඛනයෙහි පරිදි මිළ ගණන් කැඳවනු ලැබේ.

උපලේඛනය

| අංකය | විස්තරය | ලංසුපත් අංකය | ආපසු නොගෙවන ලංසු ෆොරම ගාස්තුව (වැට් බදු සහිතව) |
|---|---|---|---|
| **1** | නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය | **1/4/7/00/167-2024** | **2360.00** |

1. **ලංසු පරීක්ෂා කිරීම -**

   මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට **2024.10.11** දින සිට **2025.10.31** දින දක්වා කාර්යාල දිනවල පෙ.ව **9.30** සිට ප.ව **3.30** දක්වා අදාළ ආයතනය වෙත පැමිණ ආයතන පරිශ්‍රය පරීක්ෂා කළ හැක.

   **දු.ක. අ - නිවාස සැලසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානය - 011-2787661**

2. **ලංසු ෆෝරමයන් නිකුත් කිරීම -**

   **2024.10.11** වෙනි දින සිට **2024.10.31** දක්වා සතියේ සාමාන්‍ය කාර්යාල දින වල පෙ.ව 09.30 සිට ප.ව **03.30** දක්වා ආපසු නොගෙවනු ලබන රු.**2360.00** ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවා රිසිට්පත් සැපයීම් නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් නියමිත ටෙන්ඩර්පත් සහ කොන්දේසි මාලාවේ පිටපත ලබාගත හැකිය. ටෙන්ඩර්පත් නිකුත්කිරීම **2024.11.01** දින මධ්‍යාන 12.00ට අවසන් වනු ඇත.

3. **ලංසු විවෘත කිරීම -**

   අනුපිටපතකින් යුක්තව මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා එම කවර දෙකම එක් තනි කවරයක බහා මුද්‍රා තබා පිටකවරයේ වම් කෙළවරේ **"2024-2025 වසර සඳහා CHPB ආයතනයේ සනීපාරක්ෂක පවිත්‍රතා සේවාව ලබාගැනීම සඳහා මිල ගණන් කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කර **2024.11.01** වන දින ප.ව **2.30**ට පෙර ලැබෙන සේ **සැපයීම් අංශය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, සව්සිරිපාය, 123, විජේරාම මාවත, කොළඹ 07** යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ ඉහත ලිපිනයේ **CIDA** ටෙන්ඩර් පෙට්ටිය වෙත අතින් ගෙනවිත් බහාලීම හෝ කළ යුතුය.

4. එම ලංසු භාරගන්නා වේලාව අවසන්වූ වහාම කොළඹ 07, නො 123, විජේරාම මාවත, සව්සිරිපාය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ සැපයුම් අංශ කාර්යාලයේදී **2024.11.01** වන දින ප.ව 2.30ට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

**සභාපති - ප්‍රසම්පාදන මණ්ඩලය**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
**සව්සිරිපාය,**
**123, විජේරාම මාවත,**
**කොළඹ 07.**